TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE

2870

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2016 (2017)

## (01) පොදු ප්‍රශ්න පත්‍රය

පැ තුනයි

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

1. රාජ්‍ය ව්‍යවසාය සහ පෞද්ගලික අංශය දිගුකාලීන ආයෝජන සඳහා දිරි ගැන්වීමට ශ්‍රී ලංකා රජයට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් විස්තර කරන්න.

2. "තාක්ෂණය වෙනස් වනු ඇත. එහෙත් ආර්ථික මූලධර්ම වෙනස් නොවනු ඇත." මෙම ප්‍රකාශයේ ඇති වලංගුතාව පිළිබඳව කරුණු දක්වන්න.

3. නවෝත්පාදනය (innovation) සාර්ථක කර ගැනීමට සහ එමගින් රටේ ආර්ථික පදනම දියුණු කිරීමට රජය කෙතරම් දුරට ආයෝජනකරුවන්ට සහය දැක්විය යුතු ද?

4. මෑතක දී යුරෝපීය සංවිධානය (EU) ශ්‍රී ලංකාවට G.S.P.+ සහනය ප්‍රදානය කර ඇත. ශ්‍රී ලංකාවෙන් යුරෝපීය සංවිධානයට අයත් රටවලට කෙරෙන අපනයනවලින් 80% ක් එක්සත් රාජධානිය සඳහා වේ. එහෙත් එක්සත් රාජධානිය වර්ෂ 2019 දී යුරෝපීය සංවිධානයෙන් ඉවත් වීමට තීරණය කර ඇත. මෙයින් ශ්‍රී ලංකා අපනයනවලට කෙබඳු බලපෑමක් සිදු වේ ද යන්න පැහැදිලි කරන්න.

5. "ආසියාවට සහ පැසිෆික් සාගරය අවට රටවල්වලට දේශගුණික වෙනස්වීම් අතිශයින්ම බලපා ඇත." මෙම දේශගුණික වෙනස්වීම් නිසා ඉහත සඳහන් රටවලට ඇතිවී තිබෙන අලාභහානි සහ මෙවැනි උවදුරු අවම කර ගැනීමට ගතහැකි, දිගු කාලීන සංවර්ධනයට බලපාන, සහනදායී ක්‍රියාමාර්ග මොනවා දැයි පැහැදිලි කරන්න.

6. සමාජයේ යහපත තහවුරු වන අන්දමට සංචාරක ව්‍යාපාරය දියුණු කළ හැක්කේ කුමන අන්දමට ද?

7. චීනයේ "එකම තීරයක් එකම මාර්ගයක් (One Belt, One Road)" ක්‍රියාත්මක කිරීමේ දී ඇති විය හැකි ආර්ථික හා දේශපාලන ක්‍රමෝපාය බලපෑම් මොනවා ද?

8. සෑම දිනකම කසළ මෙට්‍රික් ටොන් 6 000 ක් රට පුරාම එකතු වේ. මින් අඩකට වැඩි ප්‍රමාණයක් එකතු වන්නේ බස්නාහිර පළාතෙනි. මෙසේ කසළ ගොඩ ගැසීමෙන් ඇතිවන විනාශකාරී බලපෑම්වලින් මිදීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද?

9. "තොරතුරු තාක්ෂණය නිසා ඉදිරි අවුරුදු 5 - 10 තුළ දී බොහෝ සාම්ප්‍රදායික කර්මාන්තවලට බාධා ඇති වන අතර ඒවා ක්‍රියාත්මක වන ආකාරය බෙහෙවින්ම වෙනස් වනු ඇත." මේ ගැන ඔබගේ අදහස් මොනවා ද?

10. ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපති, පැරිස් දේශගුණික ගිවිසුමෙන් (Paris climate agreement) ඉවත් වීමට තීරණය කිරීම පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.

***

SLExam.com

SLExam.com

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE

2869

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)

## (02) ලෝක තතු I (දේශපාලන)

පැ තුනයි

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

1. අන්තර්ජාතික කටයුතු හා සම්බන්ධ ක්‍රියාධරයින් අතුරින් රාජ්‍යයන් ප්‍රධාන ක්‍රියාධරයා ලෙස සලකන්නේ මන්ද?

2. වර්තමාන ලෝක ක්‍රමය තුළ අන්තර්ජාතික සංවිධානවල ක්‍රියාකලාපය විමසන්න.

3. පහත දැක්වෙන ඒවායින් එකක් පිළිබඳව විවේචනාත්මක විග්‍රහයක් කරන්න.
   (i) කටාර් අර්බුදය
   (ii) අවි ආයුධ පාලනය හා නිරායුධකරණය
   (iii) අන්තර්ජාතික මත්ද්‍රව්‍ය පරිවහනය
   (iv) ආගමික මූලධර්මවාදය
   (v) රාජ්‍ය උපාය නිලධාරීන්ගේ කාර්යභාරය

4. අන්තර්ජාතික ත්‍රස්තවාදයේ ස්වරූපය විස්තර කර, ලෝකයේ දේශපාලන හා ආර්ථික ස්ථාවරභාවය කෙරෙහි එහි බලපෑම විමසන්න.

5. "උතුරු කොරියාවේ හිතුවක්කාරී හැසිරීම ලෝක සාමය හා සුරක්ෂිතභාවය කෙරෙහි දැඩි තර්ජනයක් එල්ල කර ඇත." මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

6. මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් අන්තර්ජාතික මානව හිමිකම් කවුන්සිලයේ කාර්යභාරය විමසන්න.

7. අන්තර්ජාතික සාමය ගොඩනැගීම සහ පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහාලේකම්වරයාගේ භූමිකාව විස්තර කරන්න.

8. පහත දැක්වෙන ඒවායින් දෙකක් පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්යභාරය දක්වන්න.
   (i) නීත්‍යානුකූල අයුරින් ගැටුම් සමථකරණය කිරීම
   (ii) සහශ්‍රක සංවර්ධන අරමුණු යථාර්ථීකරණය කර ගැනීම
   (iii) දුගීභාවය අවම කිරීම
   (iv) දේශගුණය වෙනස් වීම සහ මිහිතලය උණුසුම් වීම

9. ඔබගේ මතයට අනුව, කලාපීය සහයෝගිතාව උදෙසා සාර්ක් සංවිධානය දරන ප්‍රයත්න අඩපණ වීම කෙරෙහි බලපා ඇති සාධක මොනවා ද?

10. වර්තමාන සහාග ආණ්ඩුව බලයට පත් වූ දිනයේ සිට
    එක්කෝ ඉන්දියාව සමග
    නැතිනම් චීනය සමග
    ශ්‍රී ලංකාව පවත්වන සම්බන්ධතාවන්හි ස්වරූපය විමසන්න.

* * *

SLExam.com

SLExam.com

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2016 (2017)

## (03) ලෝක තතු II (ආර්ථික)

පැ තුනයි

● ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

---

1. ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි මෑත කාලීන ගෝලීය ආර්ථිකයේ වෙනස්කම් බලපා ඇත්තේ කෙසේද යන්න සැකෙවින් පැහැදිලි කරන්න.

2. ගෝලීය ආර්ථිකය හා ශ්‍රී ලංකා ආර්ථිකය අතර ඇති සබඳතාව වැඩි දියුණු කිරීම සඳහා පසුගිය දෙවසර තුළ ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවා ද?

3. මෑත වර්ෂවල ශ්‍රී ලංකාව මුහුණ පා ඇති වෙළඳ ශේෂ හිඟයට බලපා ඇති දේශීය හා ගෝලීය හේතු කවරේ දැයි පැහැදිලි කරන්න.

4. (i) 'පැසිෆික් කලාපීය හවුල්කාර ගිවිසුම (Trans - Pacific Partnership - TPP)' යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
   (ii) මෙම හවුල්කාර ගිවිසුමට ඇතුළත් පැසිෆික් කලාපීය රටවල් දොළහ නම් කරන්න.

5. (i) වෙළෙඳ බාධක අඩු කිරීමෙහි ලා යොදා ගන්නා ද්විපාර්ශ්වික හා කලාපීය ගිවිසුම් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
   (ii) ශ්‍රී ලංකාව මෑත කාලයේ දී කලාපීය සහ ද්විපාර්ශ්වීය වශයෙන් ඇති කරගෙන තිබෙන සහ ඇති කර ගැනීමට යෝජිත වෙළෙඳ ගිවිසුම් සඳහන් කරන්න.

6. (i) (අ) නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් මොනවා ද?
   (ආ) ලෝක බැංකුවට අනුව එම ආර්ථිකයන් අතුරින් විශාලතම නැගී එන ආර්ථිකයන් පහ නම් කරන්න.
   (ii) ශ්‍රී ලංකාව අත් කර ගෙන ඇති සහශ්‍ර සංවර්ධන ඉලක්ක දකුණු ආසියා කලාපීය රටවල් සමග සන්සන්දනය කරන්න.

7. (i) (අ) 'ආර්ථික අනුකලනය (Economic Integration)' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
   (ආ) ආර්ථික අනුකලනය සඳහා උදාහරණ දෙකක් දෙන්න.
   (ii) යුරෝපා සංගමයට (EU) අයත් රටවල් නම් කර, එහි ආරම්භය සහ සංවිධාන ව්‍යුහය පිළිබඳව විස්තර කරන්න.

8. (i) 'ලෝක වෙළෙඳ සංවිධානය (WTO)' යනු කුමක් ද?
   (ii) ලෝක වෙළඳ සංවිධානය පිළිබඳව පහත සඳහන් මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.
   (අ) කාර්යයන් (Functions)
   (ආ) මූලධර්ම (Principles)
   (ඇ) සංවිධාන ව්‍යුහය (Organizational Structure)
   (ඈ) ප්‍රධාන විෂයයන් (Key Subjects)

[ 2 වැනි පිටුව බලන්න.

SLExam.com
SLExam.com

TO BE PUBLISHED IN
THE WEBSITE OF DOE



**9.** (i) (අ) 'වෙළෙඳ හවුල් (Trading Blocs)' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) වෙළෙඳ හවුල්වල ගුණාංග පැහැදිලි කරන්න.

(ii) පහත සඳහන් ප්‍රමුඛ වෙළෙඳ හවුල්වලින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA)

(ආ) ලතින් ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (LAFTA)

(ඉ) දකුණු ආසියාතික නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA)

(ඊ) ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA)

**10.** පහත සඳහන් ඕනෑම හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකා ආර්ථික සමුළුව - 2015

(ii) ගෝලීය තරගකාරිත්ව දර්ශකය

(iii) ආර්ථික ගෝලීයකරණය

(iv) G - 7 කණ්ඩායම

(v) BRICS රටවල්

(vi) ලෝක ආර්ථික සමුළුව

***

SLExam.com

SLExam.com

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE

2869

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2016 (2017)

**(04) රචනය**

පැ තුනයි

- පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් තෝරාගෙන විශ්ලේෂණාත්මක වාක්‍ය රචනා ලියන්න.

1. ජනතාවගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා සමාජ වෙබ්අඩවි භාවිත කළ යුතු යෝග්‍ය ආකාරය
2. ශ්‍රී ලංකාවේ වීථි දරුවන් පුනරුත්ථාපනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ ක්‍රමෝපාය
3. රටක සමාජ - ආර්ථික සංවර්ධනය විෂයෙහි වැඩවර්ජන මගින් ඇතිවන බලපෑම
4. නීතියේ ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීම රටක ජනතාවගේ මෙන්ම රජයේ ද යුතුකමකි
5. ආසියානු රටවල සංවර්ධනය කෙරෙහි බටහිර රටවල මැදිහත් වීම
6. රුපියල අවප්‍රමාණය වීම මගින් ශ්‍රී ලාංකේය ආර්ථික ව්‍යුහයට ඇතිවන බලපෑම්
7. කාලගුණික විපර්යාස හා අනාගත ගෝලීය අභියෝග
8. දේශීය හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය හා විධිමත් කිරීම මගින් මෙරට ආර්ථිකයට සැපයෙන පිටුබලය
9. ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා කාන්තා ශ්‍රමය හා දැනුම විධිමත්ව යොදා ගැනීමේ අවශ්‍යතාව
10. ලෝක සාමය හා සංහිඳියාව සුරක්ෂිත කිරීමෙහි ලා ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම මර්දනය කිරීමේ වැදගත්කම
11. ශ්‍රී ලංකාවේ අතිශයින් ජනප්‍රිය 'බිග්මැච්' මගින් ශිෂ්‍ය විනය කෙරෙහි ඇති කෙරෙන බලපෑම
12. අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ දී ජනතාව සතු කාර්යභාරය

* * *

SLExam.com

SLExam.com